**මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය - 2022**

**----------------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රිවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව

හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ආයතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| **අදාල ප්‍රමිතයට යොමුව සහිතව අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවමත් භාවිතයේ පවතින පිරිවැය වටිනාකම රු.53,558,228 ක් වූ වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. එසේම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව මෙකී වත්කම්වල ඵලදායී ජීවිත කාලය නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | ආයතනයේ මේ වන විට සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති ජංගම නොවන වත්කම් වල වටිනාකම රු. 53,492,401.18 ක් වේ. කෙසේ වෙතත් මේ වන විට ආයතනයේ සියළුම ජංගම නොවන වත්කම් වර්ගීකරණය කරමින් ලේඛනගත කිරීමේ කටයුතු ඉටු වෙමින් පවතී. ඉන්පසු ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිත 07 හි 49 ඡේදය අනුව සියළුම ජංගම නොවන වත්කම් භාණ්ඩයන් ප්‍රත්‍යාගණනය කිරීමට නියමිතය. ඉන්පසු ජංගම නොවන වත්කම් වල නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීමට හැකි වනු ඇත. | ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| **අදාල ප්‍රමිතයට යොමුව සහිතව අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) දේපළ පිරියත හා උපකරණ තුල ඇතුලත් රු. 2,301,575 ක් වූ මැණික් ගල් ප්‍රමාණය වසර හතරකට අධික කාලයක සිට ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | මෙම මැණික් ගල් වටිනාකමෙන් අඩු සහ ශිෂ්‍යයන් හට රළු මැණික් වර්ග හඳුනා ගැනිම සඳහා දෙනු ලබන සාම්පල් වන බැවින් අවුරුදු 04 ක් ඉක්මවූ විගස ප්‍රත්‍යාගණනයක් සිදුකිරීම අවශ්‍ය නොවන අතර, එම ගල් තොග වල වර්තමාන වෙළඳපල මිල අනුව අවශ්‍ය අවස්ථාවන්හිදී ප්‍රත්‍යාගණනය සිදුකිරීමට කටයුතු කරනු ඇත. | නිවැරදිව ගිණුම් තැබිය යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) බැංකු සැසඳුම් ප්‍රකාශනය අනුව 2022 දෙසැම්බර් 31 දිනට සෘජුවම බැංකුවෙහි තැන්පත් කල වටිනාකම රු.1,635,470 ක් වූ අතර, මෙම ශේෂය තුල ඇතුළත්ව ඇති 2020 හා 2021 වර්ෂයන්වලදී බැංකුවට සෘජුවම තැන්පත් කර තිබූ වටිනාකම රු.319,710 ක්ද වූ අතර මෙකී සෘජු තැන්පතු මොනවද යන්න හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | සෘජු තැන්පතු ලෙස පවතිනුයේ පුහුණු පාඨමාලා හදාරනු ලබන සිසුන් විසින් පාඨමාලා ගාස්තු ලෙස සෘජුවම බැංකුවට බැර කර ඇති එහෙත් ආයතනයට එම බැංකු තැන්පතු පත්‍රය ඉදිරිපත් කර ඊට අදාල මුදල් කුවිතාන්සි ලබා නොගත් පාඨමාලා ගාස්තු වල වටිනාකම වේ. හඳුනා නොගත් එම තැන්පතු වර්ෂ දෙකක් ඉක්මවීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව ආදායමට ගැනීමට කටයුතු කරනු ඇත. මින් ඉදිරියට ශිෂ්‍යයන් විසින් සෘජු තැන්පතු ලෙස බැංකුවට මුදල් බැර කරන විට එම තැන්පතු පතෙහි ජාතික හැඳුනුම්පත් අංකය, දූරකථන අංකය සහ ශිෂ්‍ය ලියාපදිංචි අංකය ඇතුලත් කිරීමට සිසුන්ට උපදෙස් ලබාදීමට අපේක්ෂා කෙරේ. එමඟින් සැසඳුම් නොවන සෘජු ප්‍රේෂණ ඉදිරියේදී අවම කර ගැනීමට හැකි වනු ඇත. | සෘජු තැන්පතු හඳුනාගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 5,319,778 ක අලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අලාභය රු. 12,105,126 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,785,348 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පාඨමාලා ආදායම රු.11,986,550 කින් ඉහල යාම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩිපුර ගෙවූ වැටුප් ශේෂය තුල, නිලධාරීන් 04 දෙනකුගෙන් වාරික වශයෙන් අයකරගත යුතු නමුත් එලෙස අය නොවන එකතුව රු.466,762 ක් වූ මුදලක් අන්තර්ගතව පැවතුණි. | මෙම විගණන වාර්තවේ සඳහන් නිළධාරීන් 04 දෙනා දැනට ආයතනයෙන් ඉවත්ව ගිය නිලධාරීන් වන අතර ඔවුනට වැඩිපුර ගෙවන ලද වැටුප් ශේෂය වන රු. 446,761.73/- මුදල අයකර ගැනීම සඳහා නීති ක්‍රියාමාර්ග ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුවට මෙම ගැටළුව යොමු කර ඇති අතර අදාළ නෛතික කටයුතු සිදු වෙමින් පවතී. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 136ක් හා තත්‍ය කාර්ය මණ්ඩලය 65ක් වූ අතර තනතුරු 71ක් එනම් අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 52 ක් | අප ආයතනයේ පවතින මෙම පුරප්පාඩු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව ගරු අමාත්‍යතුමා, ගරු රාජ්‍ය අමාත්‍යතුමා, කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්තුමිය සහ ප්‍රාථමික කර්මාන්ත | ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් බඳවා ගෙන ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ |

| | | |
|---|---|---|
| පුරප්පාඩුව තිබුණි. මෙම පුරප්පාඩු අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වන අධ්‍යක්ෂක ජනරාල් තනතුර, අධ්‍යක්ෂක(පර්යේෂණ ) තනතුර පුරප්පාඩුව පවතී. තවද, පර්යේෂණ කාර්යන් සඳහා අනුමත තනතුරු 29 න් 24 ක් හා පුහුණු කාර්යන් සඳහා අනුමත 33 න් 19 ක් පුරප්පාඩුව පැවතීම, පර්යේෂණ හා පුහුණු කටයුතු සිදු කිරීම කෙරෙහි අහිතකර අකාරයෙන් බලපා තිබුණි. | අතිරේක ලේකම්තුමා දිගින් දිගටම දැනුවත් කලද මේ වන විට අදාල පුරප්පාඩු බඳවා ගැනීම් සඳහා අනුමැතිය නොලැබීම මත මෙම බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි වී ඇත. පර්යේෂණ හා පුහුණු අංශ සම්බන්ධයෙන් තාක්ෂණික කාර්යය මණ්ඩල හිඟය ආයතනයේ පර්යේෂණ හා පුහුණු කටයුතු වල කාර්ය සාධනය සඳහා අහිතකර බලපෑමක් ඇති වී තිබෙන බව පිලි ගනිමි. සහකාර අධ්‍යක්ෂ (රත්නවිද්‍යා) තනතුර සඳහා ද බඳවා ගැනීම් සිදු කිරීමට අනුමැතිය ඉල්ලා සිටියද ඒ සඳහා අනුමැතිය ලැබී නොමැති බව පෙන්වා දෙමි. | යුතුය. |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය ඉදි කිරීම සඳහා 2016 වර්ෂයේදී රු.14,204,402 ක් වැය කර 30 අවුරුදු බදු පදනම මත ලබාගත් ඉඩමෙහි, ප්‍රවර්තන වර්ෂය තෙක් අදාල කාර්යන් සිදු නොවීම හේතුවෙන් වසර 06 කට අධික කාලයක සිට එම ඉඩම ඌණ උපයෝජිතව පැවතුණි. | මෙම ඉඩමෙහි ඉදිකිරීමට අපේක්ෂිත ගොඩනැගිල්ලට අදාලව 2018/09/04 දිනැතිව සංකල්ප සැලැස්ම සහ ඇස්තමේන්තු පිරිවැය වාර්තාවක් ඉංජිනේරුමය පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය මගින් සකස් කරවාගෙන ඇත.<br><br>ඉන්පසුව එම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව මගින් අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය ඉටුකිරීම සහ අවශ්‍ය ලිපි ලේඛන සකස් කිරීම සඳහා එවකට පැවති අමාත්‍යාංශය වන මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ සහය ලබා ගැනීම සඳහා ප්‍රයත්න දරා ඇත.<br>මෙම ගොඩනැගිල්ල සාදා නිම කිරීමේ අරමුණින් 2021 සිට 2025 පස් අවුරුදු සැලැස්මටද එය ඇතුලත් කරන ලද අතර සැලසුම් කරන ලද පරිදි එම බාහිර උපදේශන සේවය 2021 වසරේදී සිදු කිරීමට නියමිත වුවත් ප්‍රතිපාදන වල හිඟතාවය මත ක්‍රියාකාරී සැලසුමට ඇතුලත් කිරීමට නොහැකි විය.<br><br>2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 ට අනුව රාජ්‍ය වියදම් පාලනය කිරීමේ අරමුණින් නිකුත් කර ඇති චක්‍රලේඛය මගින් නව ගොඩනැගිලි සඳහා ප්‍රතිපාදන ලබා නොදෙන බව සඳහන් කර ඇත. | අදාල කාර්යන් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආයතනයේ ගිණුම් කටයුතු සඳහා 2017 වර්ෂයේදී රු. 346,035 ක් වැයකර මිලදීගත් ගිණුම්කරණ මෘදුකාංග පද්ධතිය, වසර 06ක් ගතවී ඇතත් එහි පැවති අඩුපාඩු හේතුවෙන් එම පද්ධතිය භාවිතා කර ගිණුම් කටයුතු පවත්වාගෙන ගොස් නොමැති අතර මෙම මෘදුකාංගය භාවිතා කිරීමේදී සිදුකල යුතු යාවත්කාලින කිරීම් හා නඩත්තු කිරීම් සම්බන්ධව සේවා ගිවිසුමක් ද නොතිබුණි. | මෙම ගිණුම්කරණ මෘදුකාංග පද්ධතිය මිලදීගත් දින සිටම ඒ ඒ වර්ෂයට අදාළ ආයතනයේ සියළුම ගෙවීම් වවුචර, මුදල් ලැබීම් කුවිතාන්සි හා අනෙකුත් ජ'නල සටහන් ඇතුලත් කරමින් පද්ධතිය යාවත්කාලීන කර ඇති නමුත් අදාළ නියෝජිත ආයතනය සමඟ සම්බන්ධ වීමේ අඩුපාඩුකම් පැවතීම හේතුවෙන් ගිණුම්කරණ මෘදුකාංගය භාවිතා කර අවසන් ගිණුම් සකස් කර නොමැති බව පිළිගත හැක.<br>කෙසේ වෙතත් ඉදිරියේදී අදාල යාවත්කාලීන කිරීම් සහ නඩත්තු කටයුතු සඳහා නියෝජිත ආයතනය සමඟ ගිවිසුමකට එළඹීමෙන් පසු මෙම පද්ධතියෙහි උපරිම ධාරිතාවය ප්‍රයෝජනයට ගැනීමට නියමිත වේ. | ආයතනයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා නියමිත කාලය තුල මෘදුකාංගය යාවත්කාලීන කිරීම හා නඩත්තු කිරීම කළ යුතුය. |